# 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත

## (8 වන වගන්තියට අදාළ විස්තර)

### අමාත්‍යාංශයේ තොරතුරු

1. දැක්ම : සෞභාග්‍යමත් පළාතක් උදෙසා තිරසර සංවර්ධනයක්

2. මෙහෙවර : දායකත්වය දක්වන සියළු පාර්ශවයන්ගේ ගුණාත්මක හා ඵලදායී ප්‍රවේශයන් සමඟ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම තුළින් පළාතේ තිරසර සංවර්ධනය ළඟා කර ගැනීම

3. අරමුණු :
   - පළාතේ සමුපකාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම
   - සමුපකාර ක්ෂේත්‍රය, ඉඩම්, විදුලිබල හා බලශක්ති ඇතුළුව සියලු අංශවල මානව සම්පත් සංවර්ධනය.
   - අමාත්‍යාංශ විෂයයන් යටතට ගැනෙන සියලුම රාජ්‍ය ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනය
   - වයඹ පළාතේ ක්‍රීඩාව ඉහළ නැංවීම හා ක්‍රීඩාශීලී සෞඛ්‍ය සම්පන්න පරපුරක් බිහිකිරීම
   - වයඹ පළාතේ සංස්කෘතික උරුමයන් සංවර්ධනය හා සුරක්ෂිත කිරීමට අදාළව ක්‍රියාත්මක වීම

### අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු පිළිබඳ විස්තර

| අ/අ | දෙපාර්තමේන්තුව | දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම හා තනතුර | කාර්යාලයීය ලිපිනය හා දුරකථන අංකය |
|---|---|---|---|
| 01 | සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ) | රේණුකා පී. විජේරූප මිය (ලේකම්) 037-2233853 | 3 වන මහල, නව පළාත් සභා ගොඩනැගිල්ල, කුරුණෑගල |
| 02 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් 037-2222326 | 1 වන මහල, පළාත් සභා සංකීර්ණය, කුරුණෑගල |
| 03 | පළාත් ඉඩම් දෙපාර්තමේන්තුව | ආලෝක බණ්ඩාර මයා, පළාත් ඉඩම් කොමසාරිස් 037-2225205 | 3 වන මහල, පළාත් සභා සංකීර්ණය, කුරුණෑගල |
| 04 | පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ 037-2284136 | ජනාධිපති ශිල්ප ශාලිකාව, කුලියාපිටිය |
| 05 | පළාත් සංස්කෘතික අංශය | සහකාර සංස්කෘතික අධ්‍යක්ෂ | |
| 06 | සමුපකාර පදනම | | නාත්තණ්ඩිය |

**නිලධාරීන් සිය කාර්යයන් ඉටුකිරීමේදී භාවිත කරනු ලබන රීති, නියෝග, උපදේශ හා අත්පොත් වාර්තා**

ආයතන සංග්‍රහය, කාර්යපටිපාටි රීති සංග්‍රහය, විනය කාර්ය සංග්‍රහය, පළාත් මුදල් රෙගුලාසි, කාලානුරූපීව නිකුත්කරනු ලබනරාජ්‍ය පරිපාලන, භාණ්ඩාගාර හා ජනාධිපති චක්‍රලේඛ/ වයඹ පළාත් සභාවට අදාළ කරගන්නා චක්‍රලේඛ, අමාත්‍යාංශ විෂයයන්වලට අදාළ පනත්, බඳවා ගැනීමේ පටිපාටි/ සේවා ව්‍යවස්ථා/ අමාත්‍ය මණ්ඩල තීරණ ආදිය

**තොරතුරු ලබා ගැනීමට පුරවැසියාට ලබා ගත හැකි පහසුකම්**

01) තොරතුරු ලබා ගැනීමට ලිඛිත RTI 01 අයදුම්පත්‍රය හෝ ලිපියක් හෝ වාචික ඉල්ලීමක් හෝ තොරතුරු නිලධාරියා වෙත ඉදිරිපත් කර එය ලද බවට ලිපියක් ලබා ගන්න.

02) ඔබේ ඉල්ලීමට අදාළ තොරතුරු සැපයිය හැකිද යන්න පිළිබඳව හැකි ඉක්මණින්, කෙසේ වුවද දින 14 ක් තුළ දන්වනු ලැබේ.

03) ඉල්ලා සිටින ලද තොරතුරු ඔබ වෙත ලබා දීමට තීරණය කළහොත් කොමිෂන් සභාව නියම කළ ගාස්තුවක් ගෙවිය යුතු නම් එය ඔබට දන්වා එවනු ඇත. තොරතුරු ලබා ගැනීමට ගෙවීමක් කළ යුතු නම් ඒ අනුව ගාස්තු ගෙවීම මත හෝ ගාස්තු ගෙවිය යුතු නොවේ නම් ගාස්තු රහිතව ඔබට දින 14 ක් තුළ තොරතුරු ලබා දෙනු ඇත.

04) ගාස්තු ගෙවීමෙන් පසු දින 14 ක් තුළ තොරතුරු ලබා දීම අපහසු වේ නම් තොරතුරු නිලධාරියා විසින් එකී කාලය දීර්ඝ කිරීමට අවශය හේතු සඳහන් කරමින් දින 21 කට නොවැඩි අතිරේක කාලයක් තුළ ඔබ ඉල්ලා සිටි තොරතුරු ඔබට ලබා දෙනු ඇත.

05) තොරතුරු ලබා ගැනීම සඳහා වන ඉල්ලීම යම් පුරවැසියෙකුගේ ජීවිතය හා පුද්ගලික නිදහස සම්බන්ධයෙන් වන අවස්ථාවක, ඉල්ලීම සඳහා ප්‍රතිචාර දැක්වීම ඉල්ලීම ලැබී පැය 48 ක් තුළ සිදු කරනු ඇත.

06) තොරතුරු ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීමකට අදාළව,

I. තොරතුරු ඉල්ලීම සඳහා කරන ලද යම් ඉල්ලීමක් භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම.

II. පනතේ 5 වන වගන්තිය යටතේ ප්‍රදානය කිරීමෙන් මුක්ත කර ඇති තොරතුරු හේතුවෙන් යම් තොරතුරක් වෙත ප්‍රවේශ වීම සඳහා අවස්ථාව ලබා දීම ප්‍රත්ක්ෂේප කිරීම.

III. පනත මගින් නිශ්චිතවම දක්වා ඇති කාලසීමාවන්ට අනුකූල නොවීම.

IV. සම්පූර්ණ නොවූ, නොමග යවන හෝ සාවද්‍ය තොරතුරු ප්‍රදානය කාරීම.

V. වැඩිපුර ගාස්තු අය කිරීම.

VI. ඉල්ලා සිටිනු ලබන ආකෘතියෙන් තොරතුරු සැපයීමට තොරතුරු නිලධාරියා විසින් ප්‍රතික්ෂේප කිරීම.

VII. එම තොරතුරු වෙත එම පුරවැසියා ප්‍රවේශ වීම වැළැක්වීම සඳහා එම තොරතුරු විකෘතිකර, විනාශ කර හෝ අස්ථානගත කර ඇති බවට තොරතුරු ඉල්ලා සිටිනු ලබන පුරවැසියා හට සාධාරණ හේතු පැවසීම.

යන කරුණු මත අතෘප්තියට පත්වන්නේ නම් ඉහත සඳහන් අභියාචනා නිලධාරියා වෙත දින 14 ක් ඇතුළත අභියාචනයක් ඉදිරිපත් කළ හැක.

පහත සඳහන් ආකාරයට ඔබට තොරතුරු ලබා ගත

1. වැඩ අධීක්ෂණය මගින් (ආයතනය තුළ කාර්යයන් නිරීක්ෂණය)
2. ලේඛන, වාර්තා අධීක්ෂණයන් (ලේඛන/ වාර්තා පරීක්ෂා කර කියවා බැලිය හැක)
3. ලේඛන හෝ වාර්තාවලින් සටහන්/ උද්ධෘත පිටපත් කර ගත හැක.
4. ලේඛන/ වාර්තාවල අඩංගු ලියවිලිවලින් සහතික කළ පිටපත් ලබා ගත හැක.
5. ද්‍රව්‍යවල සහතික කළ නිදර්ශක ලබා ගැනීම
6. පරිගණකවල තොරතුරු ගබඩා කර ඇති විට දී ෆ්ලොපි ඩිස්කට්, දෘෂ්‍ය කැසට්පට හෝ වෙනත් විද්‍යුත් ක්‍රමයකින් හෝ මුද්‍රිත පිටපත් ලෙස තොරතරු ලබා ගත හැක

වෙබ් අඩවිය : www.moe.nw.gov.lk

දුරකථන අංක : 037-2231867/ 037-2222748/ 037-2230461/ 037-2231743/ 037-2227960

ෆැක්ස් : 037-2227958

<u>**තොරතුරු ඉල්ලීම් සම්බන්ධව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාවේ අනුමත ගාස්තු**</u>

**1. ඡායා පිටපත් සඳහා :**

(අ) A4/ කුඩා ප්‍රමාණයේ කඩදාසියක සපයනු ලබන තොරතුරු සඳහා තනි පැත්තක් රු.2/- හා එකම කොළයේ දෙපැත්ත රු.4ක් වේ.
(ආ) ලීගල් ප්‍රමාණයේ කඩදාසියක හා A3 කඩදාසියක සපයන තොරතුරු සඳහා තනි පැත්ත රු.4/- හා එකම කොළයේ දෙපැත්ත රු.8/-ක් වේ.
(ඇ) ඉහත ප්‍රමාණයන්ට වඩා විශාල කඩදාසියක තොරතුරු සැපයීමේ දී, සැබෑ වියදම අයකෙරේ.

**2. මුද්‍රිත පිටපත් සඳහා :**

(අ) A4/ කුඩා ප්‍රමාණයේ කඩදාසියක සපයනු ලබන තොරතුරු සඳහා තනි පැත්තක් රු.2/- හා එකම කොළයේ දෙපැත්ත රු.4ක් වේ.

(ආ) ලීගල් ප්‍රමාණයේ කඩදාසියක හා A3 කඩදාසියක සපයන තොරතුරු සඳහා තනි පැත්ත රු.4/- හා එකම කොළයේ දෙපැත්ත රු.8/-ක් වේ.

(ඇ) ඉහත ප්‍රමාණයන්ට වඩා විශාල කඩදාසියක තොරතුරු සැපයීමේ දී, සැබෑ වියදම අයකෙරේ.

3. තොරතුරු ඉල්ලුම්කරනු ලබන පුරවැසියා විසින් සපයනු ලබන ඩිස්කට්ටුවක්, සංයුක්ත තැටියක්, යූඑස්බී දත්ත පරිවාහකයක්/ වෙනත් ඉලෙක්ට්‍රොනික උපාංගයක් වෙත තොරතුරු පිටපත් කර දීම පිණිස එක් අයිතමයක් සඳහා රු.20/- බැගින් අයකෙරේ.
4. ආයතනය විසින් සපයනු ලබන ඩිස්කට්ටුවක්, සංයුක්ත තැටියක්, යූඑස්බී දත්ත පරිවාහකයක්/ වෙනත් ඉලෙක්ට්‍රොනික උපාංගයක් වෙත තොරතුරු පිටපත් කර දීම පිණිස සැබෑ වියදම අයකෙරේ.
5. යම් ලියවිල්ලක් හෝ විෂයයක් පරීක්ෂා කරන්නේ නම් හෝ අධ්‍යයනය කරන්නේ නම් හෝ ඉදිකිරීම් ක්ෂේත්‍රයක් පරීක්ෂාවට ලක්කරන්නේ නම් පැයකට රු.50/- බැගින් අයකෙරේ.
6. නියැදි හෝ ආකෘති සඳහා සත්‍ය වියදම අයකෙරේ.
7. ඊ මේල් මගින් සපයනු ලබන තොරතුරු සඳහා ගාස්තු අයනොකෙරේ.

ඉහත පනත යටතේ මෙම අමාත්‍යාංශයට අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා පහත සඳහන් තොරතුරු නිලධාරියා වෙත RTI 01 දරණ අයදුම්පත්‍රය මගින් අයදුම් කළ හැකිය.(මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවේ)

## තොරතුරු නිලධාරීන් පිළිබඳ විස්තර

| අ/අ | නම හා තනතුර | අභියාචනා නිලධාරී ද, තොරතුරු නිලධාරී ද යන වග | රාජකාරි ලිපිනය/ දුරකථන අංකය හා විද්‍යුත් තැපැල් ලිපිනය |
|---|---|---|---|
| 01 | කුමාරි වීරසේකර මෙය (ලේකම්) | අභියාචනා නිලධාරී | 2 වන මහල, පළාත් සභා සංකීර්ණය, කුරුණෑගල.<br>037-2231739<br>sec.nwpmoe@gmail.com |
| 02 | ආර්.එම්.ඒ. දුල්මිණි ප්‍රේමරත්න මිය (සහකාර ලේකම්) | තොරතුරු නිලධාරී | 2 වන මහල, පළාත් සභා සංකීර්ණය, කුරුණෑගල.<br>037-2231867<br>nwpmoe@gmail.com |
| 03 | ජේ.පී.යු.එස්. රණවීර මිය (සංවර්ධන නිලධාරී) | තොරතුරු නිලධාරී (විෂය නිලධාරී) | 2 වන මහල, පළාත් සභා සංකීර්ණය, කුරුණෑගල.<br>037-2230461<br>nwpmoe@gmail.com |